# ත්‍රි ධාතු හා ත්‍රි දෝෂ සංකල්පය

**ආයුර්වේද වෛද්‍ය, ධම්මිකා කුළුප්පුආරච්චි**

මනුෂ්‍ය ඇතුළු සියලු සතුන්ගේ හිත සුව පිණිස ආයුර්වේදය නම් ශාස්ත්‍රය ලොව පහල විය. ''ස්වයම්භූවා ප්‍රොක්තමිදං සනාතනං'' ආදී වශයෙන් ගැනෙන මෙම ශාස්ත්‍රය බ්‍රහ්ම සංකල්පය වූ ආදිම චින්තන ප්‍රවාහයකින් පහළ වූයේ වේ. ආයුර්වේදය ඇසුරු කරන්නා හට හිත, අහිත, සුඛ දුක්ඛ යන චතුර්විධ වූ ආයුෂය පිළිබඳ නිර්මල ඥාණය උපදී. ආයුෂය යනු ''ශරීර ඉන්ද්‍රිය සත්වාත්ම සංයෝගය'' යි. ආයුර්වේදයට අනුව ශරීරය මෙන්ම වෘක්ෂලතාදීන්ගේද සෑම සෛලයක්ම පංච භෞතික පදාර්ථ ඇත. එමෙන්ම ශාරීරික ක්‍රියා සිදුවන්නේ වාත, පිත්ත, කඵ තත්වය හේතුවෙනි. ප්‍රකෘති වාත, පිත්ත, කඵ, ධාතු වශයෙන් හඳුන්වන අතර විකෘති භාවයට වාත, පිත්ත, කඵ පත්වීමේදී එය හඳුන්වන්නේ දෝෂ නමිනි. (දූෂිත තත්වයට පත්ව වා, පිත්, සෙම්, මල වශයෙන් හඳුන්වයි). දෝෂ ධාතු සංකල්පය තුළින් ගොඩ නැගෙන විඥානය ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ මූලික පදනම වේ. භෘණකලන විද්‍යාත්මිකව, කාය ව්‍යවච්ඡේද විද්‍යාත්මකව, ශරීර ක්‍රියා විද්‍යාත්මකවද දෝෂ ධාතු සංකල්පය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැක. මෙය ආයුර්වේදඥයන්ගේ සූක්ෂම පර්යක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වුවකැයි කිව හැකිය. එසේ නැතිව මේ දැනුම වෙනස් තැනකින් ගත්තක් නොවේ. දෝෂ ධාතු සංකල්පය වූ කලී ශත වර්ෂාධික කාලයක් තුළ විවිධ නිරීක්ෂකයන් විසින් මෙන්ම නානාවිධ පර්යේෂකයන් විසින්ද එක් රැස්ව කරන ලද අපූර්ව ගවේෂණයක ප්‍රතිඵලයක් යැයි පැවසුවද එය අතිශයෝක්තියක් නොවේ. මනුෂ්‍ය ශරීරයෙහි ක්‍රියාකාරීත්වය සෙවීම පිළිබඳ අනාදිමත් කාලයක සිටම මිනිස් සිත ඇදී ගියේය. ශරීරය පිළිබඳ වෛඥාතිකත්වය ත්‍රිධාතු හා ත්‍රිදෝෂ ඇසුරින්ම ලැබිය යුතු බව ගම්‍යමාන වේ. චරක ආචාර්යවරයා, සිය සංහිතාග්‍රන්ථයේ සූත්‍ර ස්ථානයේ 18 වන අධ්‍යායේදී පවසනුයේ ශරීරයේ පැවතීම කෙරෙහි ත්‍රිදෝෂයේ විද්‍යාමාන වන මූලික වැදගත්කමයි. ''නිත්‍යං ප්‍රාණභෘතං දේහෙ වාත පිත්ත කඵාස්ත්‍රයඃ විකෘති ප්‍රකෘතිස්ථාවාතාන් භූතෙ‍‍‍‍‍ය න

පණ්ඩිතඃ'' යනුවෙනි. සියලු සතුන්ගේම ශරීරයෙහි වාත, පිත්ත, කඵ යන ත්‍රිත්වය ස්වභාවික අන්දමින් හෝ අස්වාභාවික අන්දමින් හෝ පැවතීම නියතයි. මෙයින් නිරික්ෂණය කළ හැකි ප්‍රධාන කරුණු 2කි. එනම් ස්වස්ථතා හා අස්වස්ථතා යන දෙවදෑරුම් වූ ශරීර තත්වයන්හීදී වාත, පිත්ත, කඵ යන ත්‍රිත්වය ධාතු වශයෙන්ද, දෝෂ වශයෙන්ද පැවතිය හැකි බව, මෙම ස්ථාවරයෙහි සංකල්පනික බව ශංකා රහිතව ප්‍රත්‍යක්ෂ වන්නේ චරක සූත්‍ර ස්ථාන ගත නිර්දේශයක් වූ ''රෝගස්තු දෝෂ වෛෂම්‍යං - දෝෂ සම්‍ය මරෝගතා'' යන පාඨයෙනි.

වාත, පිත්ත, කඵ නමින් හැඳින්වෙන ධාතු ත්‍රයය ශරීරයේ ඇති වීමට වැඩීමට හා රදාපැවතීමට ද එකසේම ප්‍රධාන වේ. එහෙයින් මෙය මූලධර්ම නියමය නමින් හැඳින්විය හැකිය. ඒ නිසාම මේවාට ''ධාතු'' යැයි කියනු ලැබේ. ''ධාතු'' යන්නෙහි සාහිත්‍යමය අර්ථය ''උපකාර'' යන්නය. මෙම ත්‍රිධාතු සමතාවෙන් පවත්නා විට ඇති වන තත්වය ''නිරෝග'' නමින් හඳුන්වනු ලැබේ. රෝගී අවස්ථාවේදී අසමතාවට පත් ධාතු වලට දෝෂ යන නාමය ව්‍යවහාර වේ. එහෙත් මෙහිලා සාහිත්‍යමය දෝෂ ශබ්දය යෙදීම සාවද්‍ය වේ. මෙම ධාතු කොටස් ප්‍රසන්නතාවයෙන් පවත්නා විට ශරීරයේ පැවැත්මට හා වර්ධනයටද ඉවහල් වේ. ඒවා විකෘත වූ විට නැතහොත් මල තත්වයට පත් වූ විට එසේ නොවේ. වෙනස් වූ විට ''කිට්ට'' නමින් හැඳින්වේ. කිට්ට ශරීරයෙන් බැහැර විය යුතුය. ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ස්ප්තධාතු යන අර්ථයෙහිද ධාතු ශබ්දය යෙදී තිබේ. එසේ වුවද ඒ හා යෙදෙන පදය අනුව ධාතු ශබ්දය අවබෝධ කර ගැනීම අපහසු නොවේ. වාත, පිත්ත, ශ්ලේෂ්ම යන තුන සංස්කෘතයේ වා, තප්, ශ්ලිප් යන ධාතුන්ගෙන් නිපන් වචන තුනකි. ඒවායින් ශරීරයේ කෙරෙන ක්‍රියාකාරිත්වයන්ද හැඟේ. සමහරු වාතය සුළඟ (Wind) නමින් පිත (Bile) නමින් සහ ශ්ලේෂම (Sputum) කෙල නමින්ද හඳුන්වති. එය පැහැදිලිවම කෙනෙකු නොමඟ යවන වැරදි හැදින්වීමකි. ''වා'' ධාතුවෙන් ගති (චලනය) සහ ගන්ධ (ආරම්භය) ගැනේ. වාත හෝ වායුව යන්නෙහි චලනය, ස්පර්ශ ඥානය චලන ශක්තිය, වෙනස් කර වෙන් කර දැක්වීමේ බලය සහ අනෙකුත් දේ කෙරෙහි ඇති දැනීම ද යන මේ තේරුම් ඇත්තේය. තාප යන්නෙහි අර්ථය සංතාප හෙවත් උණුසුම (Heat) යනුයි. ශ්ල්ප් යන්නෙන් එකිනෙකට ඇලී පැවතීම අදහස් කෙරේ. පිතෙන් සහ එහි ස්වභාවික ගුණාංගයන් ගෙන් උෂ්ණකය

සහ ශරීරයේ ජීව රසායනික ක්‍රියාකාරිත්වයද ඇති වේ. එසේම ශ්ලේෂමයේ ගුණාංගයක් වන්නේ ඒකාබද්ධතාව ඇති වීම රාශිභූත වීම සහ එකට එකතු වීමද යන මේවාය. ස්ථූල සහ ප්‍රක්ෂම ද යනුවෙන් දෙයාකාරයකින් මනුෂ්‍ය ශරීරයේ ධාතූන් පවති. වාතය නිරන්තරයෙන් සූක්ෂමතාවයක් පවතින බව සමහර විද්‍යාඥයන්ගේ මතය වේ. තත් සූක්ෂමතා අනුව ඒවා අනින්ද්‍රිය වේ. එහෙයින් සාමාන්‍ය වෛඥනික ස්පර්ශාත්මක ඥානයට වඩා උසස් නුවනකින් එය දැකිය යුතුය. ඒවා සාමාන්‍ය සහ අසාමාන්‍ය ද යන තත්වය දෙකින්ම හඳුන්වනු ලැබේ. චරක සංහිතාවට අනුව දෘෂ්ටිය ජීර්ණ පද්ධතියේ ක්‍රියා උෂ්ණත්වය නිපදවීම, අග්නිය, පිපාසය, මෘදු බව, චලභාවය, ප්‍රභාව, ප්‍රීතිය, ප්‍රසාදය සහ බුද්ධිමත් බවද යන මේවා පිතේ ප්‍රකෘති තත්වය නිසා ඇති වේ. සන්ධිස්ථාන වල ලිහිල් බව මෘදු ක්‍රියාකාරිත්වය ශරීරයේ සාමාන්‍ය ස්තීරත්වය සාමාන්‍ය නිර්මානය, වර්ධනය, ශරීර ශක්තිය, බලය, ඉවසීම, ධෛර්ය, අත්‍යග්නි හීනත්වය යන මේවා ප්‍රකෘති නිසා ඇති වන්නේය. උද්යෝගය, ආශ්වාස, ප්‍රාශ්වාසය, ඇවිදීම, කථා කිරීම වැනි ස්වෙච්ඡා ක්‍රියාවෙන් ද්විත්ව රස රක්තාදී සප්ත ධාතූන් ගෙන් ශරීරය පුරාම කෙරෙන ද්විත්ව සංසරණය යන මේවා ප්‍රකෘති වාතයෙන් ඇති වේ.

ආයුර්වේදයේ සංසරණ යනුවෙන් ගැනෙන්නේද, නූතන වෛද්‍ය සංස්කරණයට වඩා පුළුල් වූ අර්ථයකි. රුධිර සංසරණයට පමණක් සීමා නොවේ. ධාතු සංසරණය තුළ ශරීරයෙන් පිටවිය යුතු අපද්‍රව්‍ය නිසි ලෙස පිට වීම සප්ත ධාතූන්ගේ ප්‍රකෘති ක්‍රියාකාරිත්වයෙන් හා ප්‍රකෘති වාතයේ ක්‍රියාකාරිත්වයෙන් ද සිදු වන්නේය. වාතයෙහි මේ ක්‍රියාකාරිත්වය පිළිබඳව චරක සංහිතාවේ සූත්‍ර ස්ථානයේ 12 වන පරිච්ඡේදයේද පුළුල් විස්තරයක් සඳහන් වේ. මේ වාත, පිත්ත, කඵ යන තුන මූලික ලෙස ගත් කල ඒවා වර්ග කරීමට මූලික හේතුව කුමක්ද යන්න විචාරකයන්ට ප්‍රශ්න කළ හැකිය. සත්‍ය වශයෙන්ම එය තර්කානුකූලය එයට හේතුව ඒවා විද්‍යානුකූල වීමට වර්ග කිරීමේ ක්‍රමවත් බවක් සහ ව්‍යාකූල නොවූ පැහැදිලි තත්වයක්ද තිබිය යුතු වීමය. නිදසුනක් වශයෙන් ජීර්ණ පද්ධතිය ගැන සඳහන් කළ හැකිය. එහි මිශ්‍රනයේ පැහැදිලි ක්‍රමවත් බවක් ඇති බවක් නොපෙනේ. එසේම බුද්ධිමය ක්‍රියාවලියේත් අනිත් හැම ක්‍රියාවලියකමත් පවත්නා ව්‍යාකූල සහිත මිශ්‍රණ වල පැහැදිලි මූලික ක්‍රමයක් ඇති බවක් දක්නට

හැක්කේය. පෙර සඳහන් වූවාක් මෙන්ම මෙය හරියටම තර්කානුකූල විවේචනයකි. ආයුර්වේදයේ මෙයට අතිසූක්ෂම ලෙස පිළිතුරු සපයා තිබේ. ත්‍රිගුන සිද්ධාන්තය අවබෝධයට අපහසු විස්තර කිරීමට දුෂ්කර එකක් බවද සඳහන් කළ යුතුය. මෙවැනි ශුද්ධ සිද්ධාන්තයක් විවරණය කිරීමේදී මහත් ප්‍රයත්නයක් දැරිය යුතුවේ. එයට හේතුව සත්ව, රජස්, තමස් යන ත්‍රිගුන සහිත වාත, පිත්ත, කඵ වල අන්‍යොන්‍ය සම්බන්ධයක් පැවතීමය. නියමිත අන්දමින් ඒවා අවබෝධ කරගත් විට ඒවායේ ක්‍රියාකාරිත්වයන්ගේද නොපැහැදිලි ව්‍යාකූලතාවය ඉවත්ව යන්නේය. ඇතැම් ශාරීරික හා මානසික ක්‍රියාකාරිත්වයන්ගේද අවුල් සහගත තත්වය ක්‍රමවත් වන්නට ද වාත, පිත්ත, කඵ යන මේවා බෙහෙවින්ම ඉවහල් වේ.

ආයුර්වේදයට අනුව ශරීරයේ සියලුම ක්‍රියාකාරිත්වය වාත, පිත්ත, කඵ යන මේවායින් සිද්ධ වේ. කාය ව්‍යවච්ඡේද විද්‍යාත්මකව ඒ පිළිබඳ සකල කරුණු සවිස්තරව සඳහන් නොවුවද සාමාන්‍යය තත්වයේ විස්තර නම් දක්වා තිබේ. වාතය නිතරම සූක්ෂමව පවතී. තත් සූක්ෂමතා අනුව ඒවා අතීන්ද්‍රිය වේ. එහෙයින් සාමාන්‍ය වෛශූනික ස්පර්ශාත්මක ඥානයට වඩා උසස් නුවනකින් එය දැකිය යුතුය. ඒවා සාමාන්‍ය සහ අසාමාන්‍ය යන තත්ව දෙකින්ම හඳුන්වනු ලැබේ. චරක සංහිතාවයට අනුව දෘෂ්ටිය, ජීර්ණ පද්ධතියේ ක්‍රියා, උෂ්ණත්වය නිපදවීම, අග්නිය, පිපාසය, මෘදු බව චලභාවය, ප්‍රභාව ප්‍රීතිය, ප්‍රසාදය හා බුද්ධිමත් බවද යන මේවා සිතේ ප්‍රකෘති තත්වය නිසා ඇති වේ. සන්ධිස්ථාන වල ලිහිල් බව මෘදු ක්‍රියාකාරීත්වය ශරීරයේ සාමාන්‍ය ස්ථිරත්වය ලිහිල් බව මෘදු ක්‍රියාකාරිත්වය ශරීරයේ සාමාන්‍ය ස්තීරත්වය සාමාන්‍ය නිර්මාණය වර්ධනය ශරීර බලය බවසීම ධෛර්යය අත්‍යාග්නි හීනත්වය යන මේවා ප්‍රකෘති කඵ නිසා ඇති වන්නේය. උද්යෝගය ආශ්වාස ප්‍රාශ්වාස ඇවිදීම කථා කිරීම වැනි ස්වෙච්ඡා ක්‍රියාවන් ද්විත්ව රස රක්තාදී සප්ත ධාතුන්ගේ ශරීරය පුරාම කෙරෙන ද්විත්ව සංසරණය යන මේවා ප්‍රකෘති වාතයෙන් ඇති වේ. පිත්ත ධාතුවෙන් ශරීරය තුල සියලු මහා භූතයන් නියෝජනය වේ. තේජෝ මහා භූතය ප්‍රධාන වේ. එහි නිර්මාණය පංච භෞතික වන නමුත් සූක්ෂ ස්වරූපයෙන් එය සෑම සෛලයකම ඇත්තේය. ශරීරයේ කොටස් කිහිපයකම එය ස්තූලයෙන් පවතී. මේ ස්ථූල අවස්ථාව ගැන කරුණු දැක්වූ ප්‍රථම ලේඛකයා හැටියට ආචාර්ය සුශ්‍රැත නම

ඉතිහාසය ගත වේ. චරකාචාර්යයන් විසින් ද එහි ක්‍රියාකාරිත්වය විදහා දක්වන ලද නමුත් ආචාර්ය සුශ්‍රැත මෙන් ඒ පිළිබඳ විශේෂ විස්තර නොදැක්විණි. ආචාර්ය වාග්භට විසින් ද එය විස්තර කර දක්වා ඇත. චරක සංහිතාවේ සඳහන් වන අන්දමට පිතින් ශාරීරිකව උෂ්ණත්වය අග්නිය හා පිපාසය යන මේවා ඇති වන්නේය. අග්න්‍යාශයෙන් උනන අභ්‍යන්තරික ස්‍රාවයන් ඇති වන ඉන්සියුලීන් ද මේ වර්ගයට ඇතුළත් විය යුතුය. සෛල පටක වල ක්‍රියා වලට ශර්කරා මෙන්ම ඉන්සියුලින්ද උපකාරි වේ. දිරවීම පිළිබඳ වූ මෙම ක්‍රියාකාරි අවස්ථාවන් මෙහෙය වන්නේ වාතයෙනි. තේජස, ලැජ්ජාව අවුල් සහගත බව විඥානාත්මක හැගීම් වල පැහැදිලි ගතිය යන මේ ආදිය සිත් ප්‍රකෘති හා විකෘති ක්‍රියාවල ප්‍රතිඵලයන් වශයෙන් ඇති වේ. රස ධාතුවෙන් රක්ත වර්ණය ඇති කරන්නේද පිත විසිනි. බාහිර වස්තු දර්ශනය ශරීරයේ උෂ්ණත්වය පාලනය දහදිය පිටවීම, සමේ මෘදු බව ඇතිවීම, තෙල පදාර්ථ උරා ගැනීම, දෘෂ්ටිය මෙන්ම බුද්ධිය කෙරෙහිද විශේෂ දායකත්වයක් පිතෙන් කෙරේ. ශරීරයේ දැඩි බව මෙන්ම ලිහිල් බවද ස්ථූලභාවය මෙන්ම කෘෂ භාවයද උත්සාහය හා අලස බවද වෘෂත්වය හා ක්ලීවත්වය ද, නැනති බව, මෝඩ බවද, බුද්ධිය හා මෝහයද යන මෙබඳු වෙනත් යුග්ම කර්මයෝද සෙම හෙවත් කඵ ධාතුවේ කාර්යයන් වේ. මෙලෙසින් සියලු සතුන්ගේම ශරීරයෙහි වාත පිත්ත කඵ යන ත්‍රිත්වය ස්වභාවික අන්දමින් හෝ අස්වාභාවික අන්දමින් හෝ පැවතීම නිත්‍යයයි. මෙයින් අප අත් දකින ප්‍රධාන කරුණු දෙකක් වේ. එනම් ස්වස්ථතා (නිරෝගී) සහ අස්වස්ථතා (රෝගී) යන අවස්ථා ද්විත්වයෙහි ක්‍රියාකාරීත්වය ත්‍රිධාතූන්ගේ විවිධ ස්වරූප මත ශරීරය තුළ ගොඩනැගෙන බවයි. එමෙන්ම ආයුෂය ද මේ මතම පවතී.

ත්‍රිධාතූන්ගේ විකෘති ස්වභාවය ත්‍රිදෝෂ නම් වේ. එය නිවැරදි බව හා සැක රහිත බව චරක සූත්‍රස්ථානයේ සඳහන් 'රෝගස්තු දෝෂ වෛෂම්‍යං-දෝෂ සම්‍යා මරෝගතා' යනුවෙන් සඳහන් වන පාඨයෙන් තේරුම්ගත හැක. සියලුම රෝගයන්හි ත්‍රිදෝෂයේ විෂමතාවය වන්නේය. මෙයින් විවිධ වූ රෝග සමූහයාගේ ප්‍රාදූර්භූත වීම සංකීර්ණ වූ දෝෂ තත්ත්වයේ ස්වරූපයෙන් සිටීම සමඟ සමානුපාත වන බවයි. 'දෝෂ විකෘතියඃ මිත්‍යහාර විහාර ප්‍රකුපිත වාත පිත්ත කඵජඃ' යන සූත්‍ර පාඨයෙන් ද, පථ්‍යාහාර විහාරාභ්‍යං-කාය මානස කල්පනා, සාරාර්ථ සංග්‍රහය, මිථ්‍යාහාර විහාරාභ්‍යං-රෝගාශ්වාප්‍යුපජායතේ

යන පාඨයෙන්ද දක්වන ලද පරිදි ආහාර විහරණ මිථ්‍යෝපචාරය, හේතු කොට සිටී. එනම් ත්‍රිදෝෂය යනු භෞතික මූල පදනමකින් යුත් විචල්‍ය ස්වරූප ශරීර පදාර්ථයක් ලෙස විස්තර කළ හැක. 'හේතු ලිංගෞෂධඥනං ස්වස්ථාතුර පරායනම්' ලෙස චරක මුණිවරයා රෝග නිරෝග තත්ත්වයන්හි පරමාදර්ශය සඳහා දක්වා සිටිනුයේ රෝග හේතු රෝග ලක්ෂණ හා ඖෂධ යන තුන් වැදෑරුම් වන මූලික සිද්ධාන්තයන්හි ඥානය සම්මිශ්‍රිත කළ යුතු බවයි. මිථ්‍ය (වැරදි සහිත) ආහාර විහාර (හැසිරීම් රටා) හා ඖෂධ හේතුකොටගෙන ධාතු තත්ත්වයෙන් පවතින වා, පිත්, සෙම්, දූෂණය වේ. එසේ දූෂණය වීමෙන් ප්‍රකෘති වාතය, විකෘති වී වෘද්ධි වාත, ක්‍ෂණ වාත ලෙසත් ප්‍රකෘති (ධාතු තත්ත්වයේ පවතින) පිත විකෘති වී වෘද්ධි පිත හා ක්‍ෂණ පිත ලෙසත්, වෙනස් වීමෙන් ත්‍රිදෝෂ තත්ත්වයට පත්ව ශරීරයෙහි නොයෙකුත් රෝග ඇති කරයි. කඵ හෙවත් ශ්ලේෂ්මලය ද මෙලෙසට වෘද්ධි හා ක්ෂණ තත්ත්වයන්ට පත් වී සෙම් රෝග ඇති කරයි. යථා භූත තත්ත්වයෙන් සිටි තුන් දොස ශරීරය දරා සිටින ධාතුන් ය. ශරීරය දූෂණය කිරීමට ඔවුහු යම් ලෙසකින් ක්‍රියා කරන තත්ත්වයක් වෙත් නම් ඒ දෝෂ අවස්ථාවයි. එවිට ක්ලිෂ්ට තත්ත්වයට පත්වන ශරීරයේ පදාර්ථවල දෝෂ අවස්ථාව මල යැයි ව්‍යවහාරිතය. ත්‍රිදෝෂයේ ගුණ හා ක්‍රියාකර්ම ද ඒ ඒ දෝෂ වෘද්ධි වීමේදී සහ ක්ෂිණ වීමේදී පහල වන ශාරීරික හා ශායනික ලක්ෂණ ද විශ්ලේෂණයට භාජනය කළ විට පෙනී යන කරුණක් නම් ත්‍රිදෝෂයේ විද්‍යමාන ගුණ වර්ග කිහිපයකට බෙදිය හැකි වන බවය.

1. භෞතික ගුණ - රූක්ෂ ශීත උෂ්ණ ආදි
2. රසායනික ගුණ - අම්ල මධුර කටුක ආදි
3. මානසික ගුණ - තමස් සත්ව රජස් ආදි
4. උත්පාදන ගුණ - ක්‍රියාරම්භත්වය ආදි
5. භංග ගුණ - පාචක දහන ආදී
6. ස්ථිති ගුණ - ස්තම්භන ප්‍රමාර්ථ යොගවාහි ආදි

ත්‍රිදෝෂය පිළිබඳ ව ඉදිරිපත් කළ හැකි නව සංකල්ප ගොඩනගා ගැනීම සඳහා ඉහත කී වර්ගීකරණය උදව් වේ. එනම් වාත නමැති සංකල්පය ගණිත මිණිත පරාමිතිවලට හසු කළ නොහැකි දාර්ශනික සංවේදයක් වන නමුත් ඊට අයත් ගුණ ක්‍රියාකාරිත්වය එය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන ප්‍රතිඵල ඉන්ද්‍රිය ගෝචර වේ. ඉන්ද්‍රිය ගෝචර වන[6] සෑම ධර්මතාවක්ම ගණිත මිණිත පරිමාණයට විෂය කළ හැකිය. ආයුර්වේද මූල සූත්‍ර අනුව වුවද මේ ක්‍රමය සම්ප්‍රදාය විරෝධී හෝ ක්‍රම විරෝධී හෝ නොවේ. ත්‍රිදෝෂයෙහි වාත දෝෂය විස්තර වන තැන්හි දී වාත දෝෂය ඉන්ද්‍රිය ව්‍යක්ත ස්වරූපයෙන් මෙන්ම අතීන්ද්‍රිය ව්‍යක්ත ස්වරූපයෙන් ද පවතින බැව් ඍෂි මතයයි. සෙසු දෝෂයන්ගේ ද තත්ත්වය මෙයම ය. මේ බව චරක සංහිතාවේ මෙසේ දක්වේ. ව්‍යක්ත මෛත්‍රියක ශෛඩවච-ගෘහ්‍යතෙ තදි යදීන්ද්‍රියෛඃ අතොත්‍යත් පුණර් ව්‍යක්ත-ලිඞග ග්‍රාහ්‍ය මතීන්ද්‍රියම් ඓන්ද්‍රිය ව්‍යක්ත දෝෂයන් ගණනයෙන් මැන බැලීමෙන් අතීන්ද්‍රිය ව්‍යක්ත දෝෂයන් සත්‍ය වශයෙන් ම ශරීරයේ මූලික තත්ත්වයේ පවත්නා බලවේග බව ප්‍රත්‍යක්ෂ වේ. තවද ත්‍රිදෝෂයට අයත් වාත පිත්ත කඵ යන පදාර්ථත්‍රය ඉතා ලඝු මානවක ඉන්ද්‍රිය ස්වරූප වශයෙන් ප්‍රකට වන්නක්ම නොව ශරීරයේ භෞතික ඒකක පද්ධතීන් ගේ සිටම අනිවාර්යයෙන් ක්‍රියාත්මක වන විශ්ව රූප, සර්පව්‍යාජ බලවේග ලෙස අවබෝධ කර ගැනීමට ද හැකි වන්නේය.

මෙම කරුණ තේරුම් ගැනීම සඳහා නිදසුනක් මෙසේ දක්විය හැක. වාත දෝෂය යනු බාහිර ලෝකයේ ක්‍රියාත්මක වන වාත වේගය යැයි මීට කලකට පෙර ඇතැම්හු සිතූහ. පසුව එය ගති, ගන්ධක ස්වරූපය දරණ නිසා ස්ථූල සත්ව පද්ධති තුළ දක්නට ලැබෙන ස්නායු ව්‍යුහාව සහ එහි ක්‍රියා වාත දෝෂ ලෙසින් සිතනු ලැබිණ. නවීනව විස්තර වන ස්නායු පද්ධතියක් සහිත ශරීර ඇත්තේ සත්ව විශේෂ අල්පයකට බවත් වැඩි ප්‍රමාණයක් සත්ව විශේෂයෙන්ම ස්නායු පද්ධතියක් නොමැති බවත් ගැන සිතන විට වාත දෝෂය මුළු විශ්වය පුරාම පැතිර ඇතැයි යන ඍෂි වාක්‍ය ගැන අපි කුමක් කියන්නමෝ ද? වාත දෝෂය ආදී දෝෂ තත්ත්වයන් වැනි ලඝු, ස්ථූල හා ස්වයං සීමිත වූ ප්‍රමාණයෙන් හා කල්පනයෙන් පමණක් ඉන්ද්‍රියයන් හා බද්ධ කළ නොහැකි බවත් එවැනි ඉන්ද්‍රියකින් ප්‍රකට වන්නේ වාත දෝෂයේ දහසකුත් ගුණ කර්ම ලක්ෂණවලින් කිහිපයක් පමණක්

බවත් අවධාරණය කර ගැනීම අතිශය වැදගත් වේ. නව්‍ය සංකල්පයන් සියල්ල කැටි කොට ගත් කළ ආයුර්වේදීය ත්‍රිදෝෂ වාදය පිළිබඳව මැවී යන්නේ එවැනි ජීව සන්තතියට පොදු වූ විශ්ව ධර්මතාවක් පිළිබඳව වීම නොවැළැක්විය හැක්කකි.

වාතාදී දෝෂයන් ස්වකීය ස්ථානයන්හි යම් වෘද්ධියක් සිදුවේද එය ඛය නොහොත් සංඛය නමින් හඳුන්වති. එහි ලක්ෂණ නම් එම දෝෂයන්ගේ වෘද්ධිය ඇති කරන සුළු ආහාර, විහරණ ඖෂධ සේවනයෙහි බලවත් අකමැත්ත ද දෝෂ වෘද්ධිය ඇති නොකරන සුළු ආහාර විහරණ ඖෂධ සේවනයෙහි බලවත් කැමැත්ත ද වේ. උදාඃ- වාතය සංචයේදී වාතය වැඩෙන (කෝප කරණ) දේවල් කෙරෙහි අකමැත්තද ඊට විරුද්ධ සිනිඳු ආදී දේවල් කෙරෙහි කැමැත්ත ද ඇති වේ. දෝෂයන්ගේ කෝප ලක්ෂණ ගැන සඳහන් කිරීමේදී, මෙසේ පෙන්වා දිය හැක. වාතාදී දෝෂයන්ගේ උන්මාර්ග ගාමිත්වය දෝෂයන්ට අයත් ස්වකීය ලක්ෂණයන්ගෙන් දර්ශනය පහළ කරවීම, සනීප මදි බව, අවබෝධ වීම, කිසියම් රෝගයක් පහළ වීම, යනාදිය දෝෂ කෝප ලක්ෂණයෝ ය. උෂ්ණ ගුණයෙන් යුත් රූක්ෂාදී දේ නිතර නිතර ගැනීමෙන් වාතය රැස් වේ. එසේ රැස් වූ වාතය, රූක්‍ෂාදී දේවල් අධිකව ගැනීමෙන් කෝප වේ. එසේ කෝප වූ වාතය උෂ්ණ ගුණ යුක්ත දේවල ගැනීමෙන් ශමනයට පත් වේ. ශීත ගුණවලින් යුක්ත තීක්ෂණාදී දේවල් වලින් පිත රැස් වේ. උෂ්ණයෙන් උෂ්ණ දේවල් (තද අව් රශ්මිය, ගින්දර) ගැනීමෙන් පිත කෝප වේ. ශීත හෝ මන්ද්‍රාදි ගුණයෙන් යුක්ත දේවල් (සෙම් වඩන) ගැනීමෙන් පිත ශමනය වේ. ශීත ගුණවලින් යුක්ත සිනිඳු දේ ගැනීමෙන් සෙම රැස් වේ. උණුසුම් දේ ගැනීමෙන් සෙම කෝප වේ. රූක්ෂාදී ගුණ යුක්ත දේවල් යෙදීමෙන් හෝ ගැනීමෙන් සෙම ශමනය වේ.

ලිපිය අවසන් කිරීමට මත්තෙන් කලින් ඡේදයකට යළිත් අවධානය රැඳවීමට සිත් විය. එහිදී මෙසේ සඳහන් කරන ලදී. වාත පිත්ත කළු නමින් හැඳින්වෙන ධාතු ත්‍රයය ශරීරයේ ඇති වීමට, වැඩීමට රඳා පැවැත්මට ද එක සේ ම ප්‍රධාන වේ. එහෙයින් මෙය මූලධර්ම නියාමය නමින් හැඳින්විය හැකිය. එනිසාම මේවාට 'ධාතු' යැයි කියනු ලැබේ. 'ධාතු' යන්නෙහි සාහිත්‍යම අර්ථය 'උපකාර' යන්නය. මෙය ත්‍රිධාතු සමතාවෙන් පවත්නා විට ඇති වන තත්ත්වය 'නිරෝග' නමින්

සහ මොවුන්ගේ වෛෂම්‍යය අවස්ථාව 'රෝග' නමින් ද හඳුන්වනු ලැබේ. රෝගී අවස්ථාවේ දී අසමතාවට පත් ධාතුවලට දෝෂ යන නාමය ව්‍යවහාර වේ. එහෙත් මෙහිලා සාහිත්‍යමය දෝෂ ශබ්දය යෙදීම සාවද්‍ය වේ. 'දෝෂ' යන්නෙහි සාහිත්‍යමය අර්ථය 'වරද' යන්නයි. එහෙත් මෙහිදී ඇතිවන දෝෂයන්ගේ අසමතාව හේතු කොටගෙන ශරීරය රෝගී වේ. තත් ධාතු කොටස් ප්‍රසන්න තත්ත්වයෙන් පවත්නා විට ශරීරයේ පැවැත්මට සහ වර්ධනයට ද ඉවහල් වේ. මෙසේ ප්‍රකෘති තත්ත්වයේ පවත්නා වාත, පිත්ත, කඵ ධාතු නමින් හඳුන්වන අතර විකෘති භාවයට පත් වුන මේවා හඳුන්වනු ලබන්නේ දෝෂ නමිනි. දූෂිත අවස්ථාවට පත් මේවාට මල යයි කියනු ලැබේ. ශරීර තත්ත්වය හා ශරීර ක්‍රියාකාරිත්වය අනුව ද මේවායේ ඒ ඒ නම් වෙනස් වන්නේ ය. බහුල වශයෙන් ම වාත පිත්ත කඵ හඳුන්වනු ලබන්නේ ධාතු හෝ නැතහොත් දෝෂ වශයෙනි. එයට හේතුව ධාතු හා මල යන දෙවර්ග යම වාත පිත්ත කඵ වලින් විකෘතිවීමයි. මෙම විකෘති අවස්ථාව දූෂ්‍ය වශයෙන් ගනු ලැබේ.

සාමාන්‍යයෙන් ධාතු නමින් හඳුන්වනු ලබන්නේ වා පිත් සෙම් හේතු කොට ශරීරයේ නිපැදෙන රස, රක්ත, මාංස, මේදස්, අස්ථි මජ්ජා යන මේවා ය. මළ වශයෙන් ශරීරයෙන් බැහැර වන මළ මූත්‍ර සෙම් සොටු දහඩිය යන මේවාටය. මේවාගෙන් ද ශරීරයට එක්තරා ප්‍රයෝජනයක් ඇත්තේය. කෙනෙකුගේ උපතේ පටන් මරණය තෙක්ම වාත පිත්ත කඵ ශරීරය ආශ්‍රය කොටගෙන පවතී. ඒවා ධාතු තත්ත්වයෙන් ප්‍රකෘතියේදී ද විකෘතියේදී දෝෂ තත්ත්වයෙන් ද ශරීරය ඇසුරු කොට පවතී. ප්‍රකෘතියේ ස්වස්ථතාවයන් විකෘතියේ දී රෝගී බවත් ප්‍රකට කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. *ආයුර්වේද ප්‍රවේශ මාර්ගය* - බී. කොළඹගේ, කවිරාජ් 2003, කොළඹ.

2. *ශ්‍රී ලංකා දේශීය චිකිත්සා සංග්‍රහය* - කුමාරසිංහ ආයසීදාස 1984, කොළඹ.

3. *දෝෂ ධාතු මළ විඥානය* - දිසානායක 1981, කොළඹ.

4. *ආයුර්වේදීය සෞඛ්‍යය සංරක්ෂණ විධි* - කුමාරසිංහ 1961, කොළඹ.

5. *චරක සංහිතාව 1 භාගය*, (1991), සංස්: කුමාරසිංහ ආරියදාස, රජයේ ආයුර්වේද දෙපාර්මේන්තුව, කොළඹ.

6. කුමාරසිංහ ආරියදාස, (1962), *සුශ්‍රැත සංහිතාව*, නුගේගොඩ: ආයුර්වේද දෙපාර්තමේන්තුව.

7. *අෂ්ටාංගහෘදය සංහිතාව* (1964), අනු: ආර් බුද්ධදාස, ලංකා ආණ්ඩුවේ මුද්‍රණය.

8. *සාරාර්ථ සංග්‍රහය*, කුමාරසිංහ ආරියදාස, (1987), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.